**කාරෙයිතිවු ප්‍රාදේශීය සභාව - 2022**

-----------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කාරෙයිතිවු ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කාරෙයිතිවු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය වෙනුවෙන් ලැබිය යුතු වැටුප් හා සභික දීමනා රු.2,746,422 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේ ගිණුම් වාර්තා පිළියෙල කිරීමේදි ඉහත කරුණ අවධානයට යොමු කරමින් පිළියෙල කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සංස්කෘතික මණ්ඩප කුලී වෙනුවෙන් ලැබූ අත්තිකාරම් රු.295,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රතිපාදනයෙන් සිදු කළ රු.1,300,000ක් පිරිවැය වූ ඉදිකිරීම් 04ක් ප්‍රාග්ධනගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයේ දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු. 1,056,992ක් ජංගම නොවන බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එසේම, මෙම ණය මුදලින් ඉදිකළ රු.1,777,911ක් පිරිවැය වූ සංස්කෘතික මණ්ඩපය වටා වූ තාප්පයෙහි වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම් රු. 4,948,029 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.3,947,941 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 25,000 | 3,000 | 3,000 | - | 25,000 | - | - | - |
| ii. | කුලී | 8,275,000 | 6,353,768 | 4,567,470 | 1,786,297 | 7,920,000 | 5,577,924 | 4,364,145 | 1,893,741 |
| iii. | බලපත්‍ර ගාස්තු | 3,355,000 | 3,286,750 | 3,286,750 | - | 3,808,500 | 2,713,043 | 3,243,043 | 2,695,342 |
| iv. | වෙනත් ආදායම් | 6,530,000 | 2,630,622 | 2,630,622 | - | 9,723,000 | 8,387,895 | 8,387,895 | - |
| | එකතුව | 18,185,000 | 12,274,140 | 10,487,842 | 1,786,297 | 21,476,500 | 16,678,862 | 15,995,083 | 4,589,083 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ සියළුම ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයේ අය කළ යුතු රාත්‍රී පොළ සහ වෙරළ උද්‍යාන කුලී රු. 75,843 ක් වූ අතර ඒවා වර්ෂ 01 සිට 14ක් දක්වා අය කිරීමකින් තොරව පැවැතුණි. | වෙරළ උද්‍යාන කුලී හිමිකරු මියගිය බැවින් එය අයකර ගැනීමට ඉදිරි පියවර ගන්නා බව. | අය කළ යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයේ ලංසු මත මස් කඩ බදුකුලී දීමෙන් ලැබිය යුතු මුදල රු.1,680,407 ක් විය. ඉන් එකතුව රු.442,773ක් මස් කඩ බදු කුලී හිමියන් 23කගෙන් වර්ෂ 26කට අධික කාලයක සිට අය කළ යුතු ඒවා විය. | හඳුනාගත නොහැකි මුදල කපාහැරීමට කටයුතු කරන බව. | අය කළ යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට හෝ කපාහැරීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිරිත වෙරළ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු.14,347,200ක වියදමින් ඉදිකර 2009 වර්ෂයේදී සභාවට භාරදී තිබූ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 17 ක් වර්ෂ ගණනාවක සිට කුලියට දීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාල ස්ථානයට පාරිභෝගිකයින්ගේ පැමිණීම අඩු බැවින් කඩකාමර කුලියට ගැනීමට කිසිදු අයෙකු ඉදිරිපත් නොවූ බව. | වෙරළ තීරයේ කඩ කාමර කුලියට දීමට වියිමත් සැලැස්මක් සකස් කර ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සභාවට අයත් සංස්කෘතික මණ්ඩපය කුලියට දීමට විධිමත් කොන්දේසි ඇතුළත් ගිවිසුමක් ලේඛන ගත නොතිබුණි. තවද, වායුසමීකරණ පහසුකම් සැපයීම මගින් සංස්කෘතික මණ්ඩපයේ භාවිතය ඉහළ නැංවීමෙන් සභාවේ කුලි ආදායම් වැඩිකර ගැනීමේ අරමුණින් රු. 2,583,960ක් වූ වායුසමීකරණ 04ක් 2022 මැයි 19 දින සවිකර තිබූ නමුත් විගණන දිනය වන විටත් එය භාවිතා කර මහජනතාවට වායුසමනය කළ සේවාවන් සහ කුලී ආදායම් ඉහළ නංවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සංවර්ධන අරමුදල් මගින් ප්‍රතිපාදන සලසා ඉහත කාර්යය මුළුමනින්ම අවසන් කිරීමට කටයුතු කරන බව. | ප්‍රාදේශීය සංවර්ධන අරමුදල් මගින් ප්‍රතිපාදන සලසා ඉහත කාර්යය මුළුමනින්ම අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පවුල් 633 ක ගෙන් රු.651,420 ක් අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | ඉදිරි කාලයේදි සම්පූර්ණයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | ඝන අපද්‍රව්‍ය ගාස්තු වියිමත්ව අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ කාර්යාල ගොඩනැගිල්ල, සංස්කෘතික මණ්ඩපය පිහිටි ඉඩම සහ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ මධ්‍යස්ථානය පිහිටි ඉඩම් සභාවේ නමට පවරා ගැනීමට විගණන දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | සභාව විසින් භාවිතා කරනු ලබන ඉඩම්වල හිමිකාරිත්වය මාරු කිරිමට කටයුතු කෙරෙමින් පවතින බව. | සභාව විසින් භාවිතා කරනු ලබන ඉඩම්වල හිමිකාරිත්වය පවරා ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවට අයත් වාහන 29ක වටිනාකම ප්‍රත්‍යාගණනය කර එහි තථ්‍ය වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | වාහනවල වටිනාකම ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන බව. | වාහනවල වටිනාකම ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව සතු ලොරි රථ 04ක්, ට්‍රැක්ටර් 04ක් සහ යතුරු පැදි 02ක් අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට වර්ෂ 05 කට අධික කාලයක සිට සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | වාහන අලුත්වැඩියා කිරීමට සහ අනෙකුත් වාහන වෙන්දේසියේ විකිණීමටත් කටයුතු කරන බව. | වාහන අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මිය ගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 03කගෙන් අයකළ යුතු හිඟ ණය ශේෂ රු. 32,860ක් එම පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට 2006 වර්ෂයේ සිට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිලධාරීන්ගෙන් හිඟ ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත් බව. | නිලධාරීන්ගෙන් හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

**4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

**4.1 සන අපද්‍රව්‍ය කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කාබනික පොහොර නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ අරමුණින් රු.289,750 ක පිරිවැයකට මිලදී ගත් මල්ටි චොපර් යන්ත්‍රය භාවිතා කිරිමට පියවර ගෙන නොතිබුණි. | වර්තමානයේ යන්ත්‍රය සවිකිරීමට කටයුතු කර ඇති බව. | කාබනික පොහොර නිෂ්පාදනය වැඩිදියුණු කිරීමට කටයුතු කළ යුතුය. |